සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
# General Certificate of Education (Adv. Level) Examination, 2024

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

**45 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන චතුර්විධ ආශ්‍රම ධර්ම නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) චතුර්විධ ආශ්‍රම ධර්මයන්ගේ පළමුවැන්න හඳුන්වා දෙන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේ සහ වජ්ජි රාජ්‍යය අතර පැවති සබඳතා සාධක **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)
   (iv) සංජය බෙල්ලට්ඨිපුත්තගේ අමරාවික්ඛේපවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න. (ලකුණු 05යි.)
   (v) මානව වර්ගයාගේ ඒකත්වය බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු කොට ඇති ආකාරය ප්‍රමාණවත් සාධක ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

2. (i) බුදුරජාණන් වහන්සේගේ සම්මාසම්බුද්ධ ගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02යි.)
   (ii) නකුලමාතා චරිතයෙන් වර්තමාන සමාජයට ලබාගත හැකි ආදර්ශ **තුනක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) බෞද්ධ ආර්ථික දර්ශනයෙහි එන සමජීවිකතාව ප්‍රමාණවත් ව පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)
   (iv) චතුර්විධ සුඛය නම් කොට එහි පළමුවැන්න විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) බුදුරදුන් ප්‍රකට කළ ආගමික සහනශීලී ගුණය වර්තමාන ආගමික ගැටුම් නිරාකරණයෙහිලා ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං" යන ධම්මපද ගාථාව නිවැරදි ව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදි ව ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිඟාලෝවාද සූත්‍රයට අනුව කුලපුත්‍රයා විසින් මිතුරන්ටත්, මිතුරන් විසින් කුලපුත්‍රයාටත් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් **දෙක** නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) පාපමිත්‍ර සේවනය පුද්ගල ජීවිතයේ පරිහානියට හේතුවන අයුරු බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) "මාපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස මංගල සූත්‍රය අවධාරණය කරයි."
   වර්තමාන සමාජ පසුබිමට සාපේක්ෂ ව ඉහත ප්‍රකාශයෙහි වැදගත්කම අවධාරණය කරන්න. (ලකුණු 06යි.)

## II කොටස

4. (i) "ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට මග පාදයි." ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

(ii) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව කෙටියෙන් දක්වා මත් උවදුර පිටුදැකීමට බෞද්ධ ඉගැන්වීම්වලින් ලබාගත හැකි පිටිවහල ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

5. (i) ත්‍රිවිධ ධර්ම සංගායනා සඳහා නායකත්වය දුන් මහතෙරවරුන්ගේ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා පවත්වන ලද ධර්ම සංගායනා විෂයයෙහි භාරතීය රජවරුන්ගෙන් ලද අනුග්‍රහය ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

6. (i) ජපන් සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලද ආභාසය නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි.)

(ii) චීන බුදුසමයේ සංවර්ධනය සඳහා ඉන්දු-චීන භික්ෂූන්ගෙන් ඉටු වූ මෙහෙය අගයන්න. (ලකුණු 10යි.)

7. (i) ශ්‍රී ලාංකේය ජනකවි හා ගීත කලාවේ පෝෂණයට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද ආභාසය විමර්ශනය කරන්න. (ලකුණු 10යි.)

(ii) අනුරාධපුර මහාවිහාරය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය වූ බව ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

8. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරදුන් වෙනුවට භාවිත කරන ලද සංකේත ගෙනහැර දක්වා, බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් කරන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** ප්‍රමාණවත් විස්තර සපයන්න.

(1) බුද්ධ ප්‍රතිමාවේ ආසන

(2) වටදාගෙය

(3) සතර සංග්‍රහ වස්තු

(4) නාලන්දා විශ්වවිද්‍යාලය

(ලකුණු 05× 2 = 10යි.)

* * *